## <u>ආර්ථික අර්බුද කාලය තුල ළමා පෝෂණ මැදිහත්වීම් සඳහා ප්‍රමුඛතා අනුපිලිවෙළ</u>

**මාතෘ හා ළමා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මන්දපෝෂණය කළමනාකරණය කිරිමේදි අනුගමනය කළ යුතු ප්‍රමුඛතා අනුපිළිවෙළ**

i. උග්‍ර තිව්‍ර මන්දපෝෂණය (උග්‍ර කෘශ බව - SAM)
ii. මධ්‍යස්ථ තිව්‍ර මන්දපෝෂණය (මධ්‍යස්ථ කෘශ බව - MAM)
iii. කෘශ වීමේ අවදානම සහිත වර්ධනය අඩාල වීම
iv. කෘශ වීමේ අවදානම රහිත අනිකුත් වර්ධන ගැටලු
v. වර්ධන ගැටළු හෝ වර්ධන ගැටළු සඳහා අවදානමක් නොමැති

සායන සඳහා සහභාගි වීමට ප්‍රවාහන දුෂ්කරතා සහිත පවුල් වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

**ආර්ථික අර්බුද අවස්ථාවන්හිදි ආහාර හෝ මුදල් සහනාධාර ලබාදිමේදි අනුගමනය කළ යුතු ප්‍රමුඛතා අනුපිළිවෙළ**

**ආර්ථික අවදානමක් සහිත, එනම් ආහාර අනාරක්ෂිත** (Z ලේත අංක 8 ගෘහ අවදානම් තත්ත්වය ඇති) පවුල්වල දරුවන් ට ප්‍රමුඛතාවය ලබාදිය යුතුයි. මෙම දරුවන් අතරින් ද, ඉහත සඳහන් අනුපිළිවෙළට i, ii, iii සහ iv කණ්ඩායම් සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුයි.

**විශේෂයෙන් සැලකිය යුතුයි -** වයස අවුරුදු 5ට අඩු දරුවන්ට ලැබෙන සහනාධාර පෝෂණ ගුණය/සුරක්ෂිතභාවය අතින් ළදරුවන්ට සහ කුඩා දරුවන්ට සුදුසු ද යන්න පිළිබඳව මාතෘ සහ ළමා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩලය සොයාබැලිය යුතුය: උදාහරණයක් වශයෙන් කිරිපිටි හෝ කිරි ආහාර නිෂ්පාදන මගින් මව් කිරි දිම ප්‍රතිස්ථාපනය කිරීමට ඇති අවදානම සොයා බැලිය යුතුය.